// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2110/38 – 2019 පෙබරවාරි 14 වැනි බ්‍රහස්පතින්දා – 2019.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්//සීඕඑම්/05/2017/30.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එල්. ජී. ඩී. ගුණතිලක මිය, අංක 01, අභයපුර, ස්ප්‍රිං වැලි.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ස්ප්‍රිං වැලි වතුයාය, ස්ප්‍රිං වැලි.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, දිවුලපිටිය, මාපලන්ගෙදර, අංක 160, කේ. එම්. සරත්චන්ද්‍ර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2017/30.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එල්. ජී. ඩී. ගුණතිලක මිය, අංක 01, අභයපුර, ස්ප්‍රිං වැලි.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ස්ප්‍රිං වැලි වතුයාය, ස්ප්‍රිං වැලි.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''බලංගොඩ ප්ලාන්ටේෂන් පීඑල්සී යටතේ ඇති ස්ප්‍රිංවැලි වතුයායේ සේවිකාවක් වන එල්. ජී. ඩී. ගුණතිලක මහත්මිය සම්බන්ධයෙන් පැවති විනය පරීක්ෂණයෙන් පසු ඇයට ලබා දී ඇති ස්ථාන මාරුව හා 2016 වසරේ ඇයගේ මාර්තු මස වැටුප ද එම වසරේම අප්‍රේල්, මැයි, ජුනි යන මාසවලට අදාළ වැටුපෙන් අඩක් ද, 2016 වසරේ වාර්ෂික වැටුප් වර්ධකය ද නොගෙවීම යුක්ති සහගත ද? එසේ නොවේ නම් මෙම සේවිකාවට හිමිවිය යුතු සහනයන් මොනවාද ? යන්න පිළිබඳව වේ''.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 - 128

---

මගේ අංකය: අයිආර්/සීඕඑම්/03/2017/108.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. ආර්. එස්. පෙරේරා මිය, අංක 21, කැරන් පෙදෙස, දෙහිවල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, අංක 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කටුගස්තොට, ගොහාගොඩ පාර, අංක 599, එච්. එම්. අනුලාවතී මෙනවිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/සීඕඑම්/03/2017/108.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. ආර්. එස්. පෙරේරා මිය, අංක 21, කැරන් පෙදෙස, දෙහිවල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, අංක 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

''ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ සේවය කළ ඩී. ආර්. එස්. පෙරේරා යන අය තමන් දැරූ තනතුරට අමතරව වැඩ බැලීමේ පදනමින් පිරිස් කළමනාකාර තනතුරෙහි රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් වැඩ බැලීමේ දීමනාවක් ලබා නොදීම සාධාරණ හා යුක්ති සහගත වන්නේ ද? එසේ නොවන්නේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජනවාරි මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 – 129

---

මගේ අංකය: අයිආර්/සීඕඑම්/01/2017/226.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. එම්. ඒ. හම්සා මයා, අංක 32, විෂ්ණු කෝවිල පාර, ඇන්ඩර්සන් පාර, දෙහිවල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කටුගස්තොට, ගොහාගොඩ පාර, අංක 599, එච්. එම්. අනුලාවතී මෙනවිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/සීඕඑම්/01/2017/226.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. එම්. ඒ. හම්සා මයා, අංක 32, විෂ්ණු කෝවිල පාර, ඇන්ඩර්සන් පාර, දෙහිවල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

'එම්. එම්. ඒ. හම්සා මයා වෙත 2014.01.16 දිනැතිව ලබා දී ඇති චෝදනා පත්‍රය අනුව පවත්වා ඇති විනය පරීක්ෂණය මගින් ලබා දී ඇති දඬුවම් යුක්ති සහගත වන්නේද ? යන්න හා එසේ නොවන්නේ නම් සේවකයාට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජනවාරි මස 26 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 – 130

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.